# 8 ජල ගැල්ම හා නෝවා සමග ගිවිසුම



81. රූපය - නෝවාගේ නැව

ලෝ වැසි සෙසු හැම දෙන ම දෙවියන් වහන්සේ අබිමුවෙහි දූෂ්‍ය වී සිටියහ; ඔව්හු සැහැසිකමින් පිරී සිටියහ. දෙවියන් වහන්සේ ලෝකය දෙස බලා එය දූෂ්‍ය වී ඇති බව දුටු සේක. මිහිපිට මිනිසාගේ කල්ක්‍රියා දරුණු ලෙස දූෂ්‍ය වී තිබුණේ ය.

(උත්පත්ති 6:11-12)

ඉහත බයිබල් පාඨයෙන් අපට පෙන්නුම් කරන්නේ ජල ගැල්මට හේතුව ලොව පුරා පැතිර ඇති මනුෂ්‍යයාගේ දුෂ්ටකම බව ය. පාපය නිසා දෙවියන් වහන්සේ ශෝක වන බවත්, එම නිසා උන්වහන්සේ දඬුවම් කරන බවත් බයිබල් කතුවරයා පෙන්නුම් කරයි. මැවිල්ලේ මුදුන්මල්කඩ වූ මනුෂ්‍යයාගේ පාපය මුළු මහත් මැවිල්ලටම විනාශකාරී ලෙස බලපාන ආකාරය නෝවා හා ජලගැල්ම තුළින් අපට පෙන්නුම් කරයි.

දෙවියන් වහන්සේ නෝවාට කතා කොට මෙසේ වදාළ සේක; "සියලු මිනිසුන් වනසාලීමට මා තීරණය කර ඇත. මන්ද මිනිසා නිසා පොළෝ තලය ම සැහැසිකමින් පිරී තිබේ. එබැවින් මම ඔවුන් සමග පොළෝ තලය විනාශ කරදමමි."

(උත්පත්ති 6:13)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත බයිබල් පාඨයෙන් අපට පෙන්නුම් කරන්නේ ජල ගැල්මේ පරමාර්ථය මිනිසා විනාශ කිරීම නොව මිනිස් වර්ගයා දෙවියන් වහන්සේගෙන් ඈත් කරන අයහපත ලොවෙන් තුරන් කිරීමයි.




ඉහත රූප සටහනේ පෙන්නුම් කරන්නේ වර්තමාන සමාජය තුළ ඇති පාපී ක්‍රියා ය. මෙම පාපී ක්‍රියා මුළු මහත් මැවිල්ලට ම විනාශකාරී ලෙස බලපායි. මෙම පාපී ක්‍රියා තුරන් කිරීමට ඔබට ගත හැකි පියවර මොනවා දැයි සිතා බලන්න. අප සැම විට ම පාපී ක්‍රියා ප්‍රතික්ෂේප කළ යුතු ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



8.2 රූපය - නෝවා පුතුන් සමග

> උන්වහන්සේ අබිමුවෙහි නෝවා කරුණාව ලැබී ය. ..... ඔහු සත්ගුණවත් මිනිසෙකි. ඔහුගේ පරම්පරාවේ නිදොස් මිනිසා ඔහු විය. ඔහු දෙවියන් වහන්සේ සමග සුහදතාවෙන් හැසුරුණේ ය. තවද, ඔහුට ෂෙම්, හාම්, ජපෙත් කියා පුත්තු තිදෙනෙක් උපන්හ.
>
> (උත්පත්ති 6:8-10)

පාපය ක්‍රම ක්‍රමයෙන් ලොව පුරා වර්ධනය වී එහි විනාශකාරී බලය තහවුරු වුවත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ගැලවීමේ නව මංපෙත් විවර කළ සේක. පාපයෙන් දූෂණය වූ මැවිල්ල විනාශ කිරීමට උන්වහන්සේ තීරණය කළත්, නෝවාගේ පවුල හා සියලු සතුන්ගේ නියෝජිතයන් බේරා ගැනීමෙන් පෙන්නුම් කරන්නේ උන්වහන්සේගේ දයා කරුණාව ය. එම නිසා නෝවා නව මැවිල්ලක ආරම්භකයා වශයෙන් තෝරා ගනු ලබයි. නෝවා තෝරා ගත්තේ ඔහුගේ යහපත්කම කරණ කොට ගෙන ය.

නෝවා මෙන් අප ද සත් ගුණවත් මිනිසුන් ලෙස ජීවත් විය යුතු ය. එසේ ම අවංකව ජීවත් විය යුතු ය. නෝවා ධර්මිෂ්ඨ ලෙස ජීවත් වූවාක් මෙන් අපත් ධර්මිෂ්ඨ ලෙස ජීවත් විය යුතු ය. එවිට අපට ද දේව කරුණාව ලැබේ.



8.3 රූපය - ජල ගැල්ම

නෝවාට වයස අවුරුදු හයසීයයේ දී දෙවන මාසයේ හරියට ම දාහත් වන දින මහා සමුද්‍රයේ සියලු උල්පත් බිඳී ජලය ගලා ගියේ ය. අහසේ කවුළු විවෘත විය.
(උත්පත්ති 7:11)

දෙවියන් වහන්සේ නෝවාට දුන් පොරොන්දුව ඒ ආකාරයෙන් ම සඵල විය. නෝවා ජල ගැල්මෙන් බේරිණි.

නෝවා තුළ තිබූ උතුම් ගුණාංග සමුදාය නිසා දෙවියන් වහන්සේ විශේෂ සැලකිල්ලට යොමු වූ අයුරුත් උන්වහන්සේගේ මිත්‍රත්වයේ හස්තය ඔහු වෙත දිගුකළ අන්දමත් ශුද්ධ බයිබලය පැහැදිලි ව පෙන්වා දී ඇත. දෙවියන් වහන්සේගේ දයා කරුණාව ලබා ගැනීම සඳහා අප ගමන් කළ යුතු මාර්ගය සම්බන්ධයෙන් නෝවාගේ ජීවිතයෙන් ලැබෙන්නේ සර්ව කාලීන වටිනාකමක් ඇති උසස් ආදර්ශයකි.

සමිඳාණන් වහන්සේ ඒ යාග පූජාවන්හි මිහිරි සුවඳ ආඝ්‍රාණය කර මෙසේ සිතා ගත් සේක; "මිනිසා නිසා මින් මතු කවදා වත් මම පොළොවට සාප නොකරමි; යොවුන් වියේ පටන් මිනිසාගේ සිත නපුරට ඇදී යන බව මම දනිමි; මා මෙවර කළාක් මෙන් මින් මතු කවදාවත් සියලු ජීවමාන සතුන් විනාශ නොකරන්නෙමි."
(උත්පත්ති 8:21)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

නැවත මුළු ලොව ම ජලයෙන් විනාශ නොකිරීමට දෙවියන් වහන්සේ තීරණය කර ප්‍රතිඥාවක් දෙන සේක. එම ප්‍රතිඥාව පහත බයිබල් පාඨ තුළින් පෙන්නුම් කරයි. උන්වහන්සේගේ දයා කරුණාව ද මනාව පෙන්නුම් කරයි. එමෙන් ම එය දේව ආරක්ෂාව හා දේව සංරක්ෂණය මතු පාපයට ගොදුරු වන මනුෂ්‍යයාට ද ලැබෙන බවට සහතිකයකි.

මා හා නුඹලා ද, සියලු ජීවමාන සතුන් ද අතර මින් මතු කවදාවත් ජල ගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ නොකිරීමට පිහිටුවා ගත් ගිවිසුම සිහි කරන්නෙමි.
(උත්පත්ති 9:15)



8.4 ජල ගැල්මෙන් පසු

දෙවියන් වහන්සේ කතා කොට, "මා හා නුඹලා ද, නුඹලා සමග සිටින සියලු ජීවමාන සතුන් ද අතර, මතු සියලු පරම්පරාවන් සඳහා මා පිහිටුවන ගිවිසුම් ලකුණ නම් මෙය යි. වලාකුළුවල මම මාගේ දේදුන්න තබමි; මා හා ලෝකයා අතර පිහිටුවන ලද ගිවිසුම් ලකුණ එය වන්නේ ය.
(උත්පත්ති 9:12-13)

දෙවියන් වහන්සේ තමන් වහන්සේ හා මුළු මැවිල්ල සමග ගිවිසුමක් කළ සේක. "දේදුන්න" එම ගිවිසුම සනාථ කරන සංකේතයක් ලෙස දක්වයි. එය දෙවියන් වහන්සේ මිනිසා සමග කරන ඒක පාර්ශ්වික ගිවිසුමකි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දේදුන්න වැහි කුණාටු අවසන් වීම දක්වන සලකුණක් විය. ඒ අනුව දිව්‍ය සංරක්ෂණය එමගින් සංකේතාත්මක ව ඉදිරිපත් කරයි. පුරාණ ගිවිසුමේ දේදුන්න දේව අනුකම්පාවේ, කරුණාවේ හා ප්‍රේමයේ සංකේතයක් විය. දෙවියන් වහන්සේ නැවත වරක් මුළු ලෝකය ම ජලයෙන් විනාශ නොකරන බවට දෙන පොරොන්දුව ගිවිසුමක් මගින් මිනිසා හා තම සම්බන්ධතාව යළි ගොඩනංවන සේක. දේදුන්න නෝවා සමග ගිවිසුමේ බාහිර සලකුණ ය.

දෙවියන් වහන්සේ නෝවා සමග ඇති කර ගත් ගිවිසුමේ පොරොන්දුව ඉටු කළ සේක. එමෙන් ම අප ද සැම විට ම අන් අයට දෙන පොරොන්දු ඉටු කළ යුතු ය. නිවසේ දී පාසලේ දී මීසමේ දී අන් අයට දෙන පොරොන්දු ඉටු කළ යුතු ය.

## ක්‍රියාකාරකම



1. අද සමාජයේ ඇති පාපී ක්‍රියා තුරන් කිරීමට පාසල් සිසුවකු වශයෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** ලියන්න.
2. අන් අයට දේව කරුණාව දැක්වීම සඳහා මීසම තුළ ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න.
3. ඔබේ දෙමාපියන්ට, ගුරුවරුන්ට, යහළුවන්ට දුන් පොරොන්දු ඉටු කරන ආකාර පහත වගුවේ ලියා දක්වන්න.

| දෙමාපියන් | ගුරුවරුන්ට | යහළුවන්ට |
|---|---|---|
| 1 .................................<br>2 .................................<br>3 ................................. | 1 .................................<br>2 .................................<br>3 ................................. | 1 .................................<br>2 .................................<br>3 ................................. |

4. නෝවාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ **තුනක්** ලියන්න.



### ජීවිතයට බිඳක්

- ★ *පාපය ප්‍රතික්ෂේප කරන්න.*
- ★ *අන් අයට දෙන පොරොන්දු ඉටු කරන්න.*
- ★ *අවංක ව ජීවත් වන්න.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.